# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 984 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 11/06/2024<br>පැය 1600 |

**මාධ්‍ය නිවේදනය**

**කාන්තාවකට තියුණු ආයුධයකින් පහර දී ඝාතනය කිරීමේ සිද්ධියකට අදාලව සැකකරුවන් අත්අඩංගුවට - මාවතගම පොලිස් වසම.**

20224.06.06 වන දින මාවතගම පොලිස් වසමේ පිලැස්ස ප්‍රදේශයේ වයස අවුරුදු 62 ක් වූ කාන්තාවක් නිවසේ නිදන කාමරය තුළ තියුණු ආයුධයකින් ගෙල කපා ඝාතනය කිරීමේ සිද්ධිය සම්බන්ධව මාවතගම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් සිදු කරන ලද විමර්ශන වලදී අනාවරණය කරගන්නා ලද තොරතුරු මත අපරාධයට සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙකු 2024.06.10 වන දින අඹන්පොල හා තන්තිරිමලය පොලිස් වසම්වලදී අපරාධය සිදු වූ ස්ථානයෙන් කොල්ලකන ලද ජංගම දුරකථනයක්ද සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 48 හා 51 වයස් වල පසු වන අඹන්පොල හා කොහිලේ ගෙදර ප්‍රදේශවල පදිංචිකරුවන් වේ .**

සැකකරුවන් විසින් මෙම ඝාතනය සඳහා යොදා ගත් පිහියක් අපරාධය සිදු වූ නිවස පිටුපස වෙල්යායක තිබී විමර්ශන නිලධාරීන් විසින් සොයගෙන ඇත.

ඉහත සැකකරුවන්ගෙන් සිදු කරන ලද ප්‍රශ්න කිරීම් වලදී හා වැඩිදුර විමර්ශන වලදී අනාවරණය වූ තොරතුරු මත මෙම ඝාතනයට ලක් වූ කාන්තාව රවටා නිධානයක් යැයි පවසා ගලෙන් නිම කරන ලද ව්‍යාජ නිධන් වස්තුවක් ලබා දෙමින් රුපියල් 1,180,000/= ක මුදලක් ලබා ගත් ස්වාමීන් වහන්සේ නමක් ලෙසින් ව්‍යාජව පෙනී සිටි පුද්ගලයෙකු, ඔහුගේ ගෝලයෙකු ලෙස පෙනී සිටි පුද්ගලයෙකු හා ඔවුන් පැමිණි වෑන් රථයේ රියදුරු ලෙස කටයුතු කල පුද්ලයෙකුද එම වෑන් රථය හා රුපියල් 350,000/= ක මුදලක් සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් එම සැකකරුවන් අවුරුදු 31,38 හා 44 වයස් වල පසු වන දියසෙන්පුර හා දොරටියාව ප්‍රදේශවල පදිංචිකරුවන් වේ .**

මාවතගම පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.